# සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස දිවිනැගුම ජාතික වැඩසටහන පිළිබඳ විමසීමක්

**එච්.ජේ.ටී හෙට්ටිආරච්චි**
සහකාර කථිකාචාරිනී, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය

thusha.hettiarachchi@gmail.com

---

## හැඳින්වීම

යුරෝපීය රටවල වුවද ඇතැම් අංශවල අස්ථාවරභාවයක් සේම ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ද ගැටලු පවතින බව දැකිය හැකිය. මෙලෙස ආර්ථික ගැටලු ඇතිවීම සඳහා ආර්ථික ලිහිල්කරණය ද හේතුවක් විය හැකිය. ඒ සඳහා වඩාත් හොඳ විසඳුමක් වශයෙන් පසුගිය රජය විසින් **"දිවි නැගුම"** සංකල්පය එළිදක්වා ඇත . මෙහිදී තනි පුද්ගලයින් වශයෙන් ආහාර නිෂ්පාදන ක්‍රියාපටිපාටියට දායක වීමක් සිදුවේ. එය රට අභ්‍යන්තර වශයෙන් ආහාර නිෂ්පාදනයක් සිදුවීමක් වශයෙන් හැඳින්විය හැකිය.  ආහාර සංවර්ධන ඇමති බැසිල් රාජපක්ෂ මහතා මෙම "දිවි නැගුම" ක්‍රියාපිළිවෙල වඩාත් ශක්තිමත් කිරීම සඳහා කටයුතු කළහ.

## දිවිනැගුම ජාතික වැඩසටහන

2011 අයවැය වාර්තාව තුළින්, එවකට ජනාධිපති රාජපක්ෂ මහතා  විසින් ජාතික ආහාර නිෂ්පාදනය කිරීම පිළිබඳ යෝජනාවක් ගෙන එන ලදී. එහිදී ගෘහ ආශ්‍රිතව එළවළු, පළතුරු වැවීම කුකුළන් ආදිය ඇති කිරීම හා පශු සම්පත් ආදී කටයුතු වැඩි දියුණු කිරීම සඳහා වඩා හොඳ ආර්ථික ප්‍රභවයක් බවට ගෘහාශ්‍රිත බිම් ප්‍රමාණය පරිවර්තනය කළ හැකි බව පෙන්වා දුන්නේය. ලෝකයේ ඇතැයි අනුමාන කරන ආහාර අර්බුදයට විසඳුමක් ලෙසට මෙම වැඩසටහන හඳුන්වා දිය හැකිය. එලෙසම ගෘහ ආශ්‍රිතව ජීවත් වන පිරිසට තමන්ගේම වගාවක් ආරම්භ කිරීමට ද අවස්ථාවක්  මෙමගින් සැලසිණි. මෙම සංකල්පය එවකට ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා විසින් තවදුරටත් ඉදිරියට ගෙන යනු ලැබීය. මෙමගින් කර්මාන්ත වශයෙන් පවතින ආර්ථික ඒකක ගෘහාශ්‍රිතව ද ඇති කරමින් ආදායමක් ලබාගත හැකිවන ආකාරයට වර්ධනය කිරීම අරමුණ විය. මහින්ද රාජපක්ෂ මහතාගේ "මහින්ද චින්තනය" තුළින් මෙම වැඩපිළිවෙල යෝජනා වී ඇත. මහින්ද චින්තනය ඉදිරි දැක්ම අනුව "ජීවනෝපාය සහ සමාජ සංවර්ධනය තුළින් 2016 වන විට සම්පත් පිරුණු සමෘද්ධිමත් ගම නිර්මාණය කරමි", යන ආදර්ශ පාඨයට අනුව දිවි නැගුම වැඩසටහන ඉදිරියට යාමක් සිදුවිය. 2011 අයවැය වාර්තාව කියවීමේදී ජනාධිපතිතුමා මෙම "දිවි නැගුම" වැඩපිළිවෙල පිළිබඳ පහත ආකාරයට අදහසක් දක්වා ඇත. "ඉදිරියේ දී විය හැකි ලෝක ආහාර හිඟයට මුහුණ දීමට හැකිවන පරිදි අප සමාජය හැඩගැස්වීම අවශ්‍යයි. කුකුළන් ඇති කිරීම, පශු සම්පත් , එළවළු , පළතුරු යනාදිය මගින් නිසි පරිදි ආහාර සැපයීම කරගත හැකිවනවා. මේ සියල්ල අපේ ගෙදර ආර්ථිකය තුළ කළ හැකිය. වියදම අඩු කාබනික පොහොර මේ සඳහා යොදා ගත හැකිය. එබැවින් කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව සහ සමෘද්ධි වැඩසටහන එකතුව ජාතික නිෂ්පාදන ක්‍රියාවලියක් හරහා ගෙවතු දශ ලක්ෂයක් ඇති කිරීම මා යෝජනා කරනවා" (දිණමිණ ,සමෘද්ධි , 2012). මෙම "දිවි නැගුම" ව්‍යාපාරය මගින් රජය ඇති කරගත් දැක්ම වන්නේ "නිරෝගී හා ආර්ථික වශයෙන් සවිබලගැන්වූ පවුල් සිටින සපිරි ගමක්  නිර්මාණය කිරීමයි.

මූලික වශයෙන් දිවි නැගුම වැඩසටහන යටතේ ළඟාකර ගැනීමට අවශ්‍ය වූයේ, "දිවයිනේ සියලුම ගම්මාන ආවරණය වන පරිදි ගෙවතු, සත්ව පාලනය හා ගෘහ කර්මාන්ත යන අංශයන්ගෙන් සමන්විත ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂයක් ඇති කිරීම" වේ.

**දිවි නැගුම වැඩසටහනේ පරමාර්ථ**

- පවුලේ පෝෂණ මට්ටම නැංවීම
- පවුලේ දෛනික ජීවන වියදම අවම කිරීම
- පවුලේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම
- අමතර ආදායම් මාර්ග බිහි කිරීම
- ග්‍රාමීය පවුල් සේවා නියුක්ත කිරීම
- ගෘහාශ්‍රිත ආර්ථිකය ශක්තිමත් කිරීම
- ස්ථිර ශක්තිමත් ආර්ථික තත්ත්වයක් ගෘහාශ්‍රිතව ඇති කිරීම (දිවිනැගුම අත්පොත,2014)

**දිවි නැගුම ව්‍යාපාරයේ අරමුණු**

මෙම "දිවි නැගුම" වැඩසටහන සාර්ථක ව්‍යවසායකයින් නිර්මාණය කිරීම එනම් ග්‍රාමීයව නිර්මාණය කිරීම අපේක්ෂාව විය. එය රටපුරා ව්‍යාප්තව යන වැඩසටහනක් ලෙසට ක්‍රියාත්මක විය. මෙමගින් ගෘහාශ්‍රිත ආර්ථික ඒකක රටපුරා ව්‍යාප්ත කිරීම අරමුණු කර ගත්හ. මෙලෙස ගෘහාශ්‍රිත ඒකක බිහිකළ යුත්තේ ඇයි යන්න මෙලෙස හේතු දැක්විය හැකියි.

- ❖ පසුගිය දශක කිහිපය තුළ මෙරට සමාජ ආර්ථික සංස්කෘතික ව්‍යුහය තුළ සිදුවී ඇති පරිවර්තනයන් නිසා පවුල් ඒකකය තුළ දෛනික ආහාර පුරුදු හා පාරිභෝජන රටාවේ සිදුවී ඇති වෙනස්කම්.
- ❖ ඒ හේතුවෙන් ජීවන රටාව තුළ දැකිය හැකි අහිතකර තත්ත්වයන් සමස්ත ජනගහනයේ නිරෝගී පැවැත්මට හා පෝෂණයට බලපා ඇත .
- ❖ අතීතයේ දී ගෘහ ඒකකය තුළ ගෙවත්ත අවම පරිසරයෙන් උකහා ගත් දේ පදනම් කරගෙන නිපදවා ගත් පළා වර්ග , අල වර්ග , ධාන්‍ය හා ඖෂධ වර්ග ඇතුලු ආහාර ද්‍රව්‍ය හා කුඩා පරිමාණයේ ගෘහ කර්මාන්තයන් පැවතියේය. අද වන විට ඒ සියලු දේ වෙළඳපොළහරහා මිලදී ගැනීමේ ක්‍රියාදාමයකට අප හැඩ ගැසී ඇත .
- ❖ අතීතයේ පටන් ගෘහස්ථය තුළ පශු සම්පත් අංශයට වැදගත් තැනක් හිමි විය. වැඩි වියදමකින් තොරව බිත්තර එළකිරි වැනිදේ නිපදවා ඊට අමතරව ගෙවත්තේ වගාවන් සඳහා පොහොර ද සපයා ගත හැක.
- ❖ පවුලේ ශ්‍රමයෙන් හා ගෘහය අවට පරිසරයෙන් ලබා ගත හැකි සම්පත් යොදවා නිපදවාගත හැකිදේ නොතකා හැරීම නිසා ගෘහ ඒකකය තුළ ආර්ථික හා පෝෂණ ගැටලු උද්ගත වී ඇත.
- ❖ අවම වියදමකින් පහසුවෙන් සපයා ගත හැකිදේ අධික මිල ගණන් යටතේ වෙළඳපලෙන් ලබා ගැනීමට හරුවී සිටීම නිසා ගෘහ ඒකකය තුළ ජීවන වියදම ද වැඩි වී ඇත .
- ❖ මෙතෙක් යටපත් කර දමා ඇති මහගු අවස්ථාවන් හා ශක්තිය නැවත අවධි කර නිරෝගී හා පෝෂණයෙන් සපිරි ගෘහ ඒකක යොමු කරවා ගැනීම මෙම වැඩසටහනේ ඉලක්කය වී ඇත.

මෙම වැඩසටහන අධීක්ෂණය හා මග පෙන්වීම සිදුකරනු ලැබුවේ ආර්ථික සංවර්ධන දෙපාර්තමේන්තුව විසිනි. මෙම "දිවිනැගුම" වැඩසටහන මගින් ඉටු කර ගැනීමට යෙදුනු අරමුණු කිහිපයක් වේ. එයින් ප්‍රධාන තැනක් ගන්නේ පවුලේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමයි. එම අරමුණ මෙම වැඩසටහන මගින් ඉටු වන්නේ පහත ආකාරයට වේ. එනම් "දිවි නැගුම" වැඩසටහන යටතේ වගා කටයුතු සිදුවීමෙන් නැවුම් එළවළු, පළතුරු දෛනික ආහාර වේලට එකතු වේ. එළකිරි, බිත්තර වැනි පෝෂණ ගුණයෙන් වැඩි සත්ත්ව නිෂ්පාදන දෛනික පාරිභෝජනය සඳහා හුරු කිරීමෙන් ද ගෙවත්ත ආශ්‍රිතව සකසා ගන්නා පොහොර භාවිතා කර වස විසෙන් තොර

එළවළු හා පළතුරු නිපදවීමෙන් ද යහපත් සෞඛ්‍ය පුරුදු හා ආහාරවල පෝෂණ ගුණයන් පිළිබඳව දැනුවත් කිරීම හා යහපත් සෞඛ්‍ය පුරුදු හුරු කරවීම තුළින් ඉහත ක්‍රියාදාමය සාර්ථක කරගත හැකිය.

"දිවි නැගුම" මගින් ඉටුකරගන්නා දෙවන අරමුණ වන්නේ පවුලේ දෛනික ජීවන වියදම අවම කිරීම යන්නයි. ගෙවත්තේ හා ගෘහ ආශ්‍රිතව නිපදවා ගත හැකි දේ පවුලේ එදිනෙදා ආහාර වේලට එකතු කර ගැනීමෙන් ගෘහය ආශ්‍රිතව පවත්නා ස්වභාවික සම්පත් හා පවුලේ ශ්‍රමය යොදවා නිෂ්පාදන වියදම අවම කිරීමෙන් ගම තුළ ගමේ නිෂ්පාදන සඳහා වෙළඳපලක් ඇති කිරීම තුළින් පවුලේ දෛනික ජීවන වියදම අවම කර ගත හැකි වේ.

තුන් වන අරමුණ වශයෙන් පවුලේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම ඉටුකර ගනු ලබන්නේ ආහාර කල්තබා ගැනීමේ ක්‍රම හඳුන්වා දීම, ඒ සඳහා පවුල් ඒකක හුරු කරවීම හා ගෙවත්ත තුළ භෝග විවිධාංගීකරණය කිරීම තුළිනි.

අමතර ආදායම් මාර්ග බිහි කිරීම ද "දිවි නැගුම" වැඩසටහනේ අපේක්ෂිත තවත් එක් අරමුණකි. ඒ සඳහා ගෘහ ඒකකයේ අතිරික්ත නිෂ්පාදනය වෙළඳපොලට යොමු කිරීමෙන් , අගය එකතු කළ නිෂ්පාදන තුළින් වැඩි ආදායමක් ඉපයීමෙන්, ගමේ නිෂ්පාදන පදනම් කරගත් ගම් මට්ටමේ ව්‍යවසායකයින් බිහි කිරීම අපේක්ෂාව විය.

ඉහත දැක්වූ ආකාරයට "දිවි නැගුම" වැඩසටහන පිළිබඳ සහ එහි අපේක්ෂිත අරමුණු පිළිබඳ අවබෝධයක් ලබාගත හැක. මුළු රට පුරා ක්‍රියාත්මක වන වැඩසටහනක් වශයෙන් "දිවි නැගුම" ව්‍යාපෘතිය ප්‍රධාන අංශ 3ක් යටතේ ක්‍රියාවට නැංවීය.

- කෘෂිකර්ම අංශය.
- ධීවර/සත්ත්ව පාලන අංශය.
- ගෘහස්ත කර්මාන්ත අංශය වශයෙනි (දිවිනැගුම අත්පොත,2014)

**දිවිනැගුම ව්‍යාපාරයේ ක්‍රියා පටිපාටිය**

පහත දැක්වෙන්නේ 2011 යල කන්නය සඳහා බීජකට්ටල ලබා දීම දිස්ත්‍රික් අනුකූලව වර්ග කර ඇති ආකාරයයි.

| අංකය | දිස්ත්‍රික්කය | අවශ්‍ය ගෙවතු වගා කට්ටල ගණන | ලබා දුන් ගෙවතු වගා කට්ටල සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කොළඹ | 55,700 | 50,890 |
| 2 | ගම්පහ | 117,700 | 117,700 |
| 3 | කළුතර | 76,200 | 76,200 |
| 4 | රත්නපුර | 57,500 | 57,500 |
| 5 | කෑගල්ල | 57,300 | 57,300 |
| 6 | කුරුණෑගල | 161,000 | 161,100 |
| 7 | පුත්තලම | 54,800 | 67,480 |
| 8 | අනුරාධපුර | 70,200 | 70,200 |
| 9 | පොළොන්නරුව | 29,500 | 29,230 |
| 10 | ගාල්ල | 89,600 | 91,463 |
| 11 | මාතර | 65,000 | 65,000 |
| 12 | හම්බන්තොට | 57,600 | 58,527 |
| 13 | මොණරාගල | 31,900 | 34,927 |
| 14 | බදුල්ල | 56,700 | 59,757 |
| 15 | නුවරඑළිය | 49,100 | 45,110 |
| 16 | මහනුවර | 118,800 | 115,266 |
| 17 | මාතලේ | 54,500 | 55,159 |
| 18 | ත්‍රිකුණාමලය | 23,000 | 23,610 |
| 19 | මඩකලපුව | 34,500 | 21,375 |
| 20 | අම්පාර | 51,200 | 55,300 |
| 21 | යාපනය | 43,500 | 43,500 |
| | මුළු එකතුව | **1,355,300** | **1,356,594** |

(දිණාමිණ ,සමෘද්ධි , 2012)

මේ ආකාරයට "දිවි නැගුම" ව්‍යාපෘතිය යටතේ ගම්පහ , කොළඹ , නුවරඑළිය , පොතුවිල්, මතුගම , කෑගල්ල , කොරෙයිපත්තු ආදී ප්‍රදේශවල වගාවන් ආරම්භ විය. එමෙන්ම පහත දැක්වෙන්නේ 2011 වසරේ ලබා දී ඇති පොල් පැල හා මහ කන්නයේ ලබාදීමට අපේක්ෂා කළ ප්‍රමාණයන් දැක්වෙන වගුවකි.

| අංකය | දිස්ත්‍රික්කය | පොල් පැල | | |
|---|---|---|---|---|
| | | අවශ්‍ය පැල සංඛ්‍යාව | නිකුත් කළ පැළ සංඛ්‍යාව | නිකුත් කිරීමට ඇති පැළ ගණන |
| 1 | කොළඹ | 13,528 | 9,787 | 93,741 |
| 2 | ගම්පහ | 207,789 | 18,005 | 189,784 |
| 3 | කළුතර | 107,417 | 23,560 | 83,857 |
| 4 | රත්නපුර | 108,000 | 12,811 | 95,189 |
| 5 | කෑගල්ල | 122,838 | | 122,838 |
| 6 | කුරුණෑගල | 124,759 | 82,749 | 42,010 |
| 7 | පුත්තලම | 109,600 | 14,845 | 94,755 |
| 8 | අනුරාධපුර | 230,992 | 0 | 230,992 |
| 9 | පොළොන්නරුව | 18,249 | 0 | 18,249 |
| 10 | ගාල්ල | 151,111 | 24,302 | 126,809 |
| 11 | මාතර | 33,600 | 10,745 | 22,855 |
| 12 | හම්බන්තොට | 95,074 | 9,285 | 85,,789 |
| 13 | මොණරාගල | 63,800 | 720 | 63,080 |
| 14 | බදුල්ල | 101,009 | 0 | 101,009 |
| 15 | නුවරඑළිය | 52,297 | 0 | 52,297 |
| 16 | මහනුවර | 218,227 | 9,400 | 208,827 |
| 17 | මාතලේ | 218,224 | 4,000 | 214,224 |
| 18 | ත්‍රිකුණාමලය | 45,385 | 0 | 45,385 |
| 19 | මඩකලපුව | 60,150 | 1,400 | 58,750 |
| 20 | අම්පාර | 54,922 | | 54,922 |
| 21 | යාපනය | | 830 | |
| | මුළු එකතුව | 2,136,971 | 222,439 | 1,915,362 |

(දිණමිණ ,සමෘද්ධි , 2012).

කුකුල් පැටවුන් බෙදාදීම සම්බන්ධව දිස්ත්‍රික්ක වශයෙන් ඇතුළත් ප්‍රමාණය දැක්වෙන වගුවක් පහත දැක්වේ.

| අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | බෙදා හරින ලද කුකුළු පැටවු ගණන |
|---|---|---|---|
| 1 | කුරුණෑගල | | |
| | | ගිරිබාව | 1,330 |
| | දිස්ත්‍රික්කයේ උප එකතුව | | 1,330 |
| 2 | ගාල්ල | හබරාදූව | 400 |
| | | බොපේ පෝද්දල | 1,956 |
| | | ගාල්ල කඩවත් සතර | 710 |
| 3 | දිස්ත්‍රික්කයේ උප එකතුව | | 3,066 |
| | මාතර | වැලිපිටිය | 380 |
| | | තිහගොඩ | 360 |
| | | හක්මන | 330 |
| | | දික්වැල්ල | 440 |
| | | දෙවිනුවර | 440 |
| | දිස්ත්‍රික්කයේ උප එකතුව | | 1950 |
| 4 | කෑගල්ල | යටියන්තොට | 500 |
| | දිස්ත්‍රික්කයේ උප එකතුව | | 500 |
| | මුළු එකතුව | | 6,846 |

(දිණමිණ ,සමෘද්ධි , 2012)

ධීවර/සත්ත්ව පාලන අංශය ආශ්‍රිතව 2011 වසර තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ සැලැස්ම ඇතුළත් ප්‍රධාන ව්‍යාපෘතීන් පහත පරිදි දැක්වේ.

- ❖ පොකුණු තුළ මිරිදිය මසුන් ,ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම.
- ❖ පොකුණු තුළ මත්ස්‍ය, මිරිදිය ඉස්සන් වගාව.
- ❖ ඒකාබද්ධ මත්ස්‍ය වගාව.
- ❖ කාලීන ජලාශවල මත්ස්‍ය වගාව.
- ❖ විසිතුරු මත්ස්‍ය වගාව.
- ❖ කුඩු තුළ මෙදා මසුන් වගාව.
- ❖ වතු ජලාශවල මත්ස්‍ය වගාව.
- ❖ වැව් ආශ්‍රිත දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා මාළු ආශ්‍රිත ආහාර නිෂ්පාදනය.
- ❖ බෙල්ලන් වගාව.
- ❖ මුහුදු පැළැටි වගාව. ධීවර පසු අස්වනු තාක්ෂණය - කරවල උම්බලකඩ, ජාඩි, ඇඹුල් තියල් හා දුම් ගැසූ කරවල නිෂ්පාදන.
- ❖ මත්ස්‍ය අලෙවි ප්‍රදර්ශන.

“දිවි නැගුම” ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත අංශය මගින් සංවර්ධනය කිරීමට අදාළ වර්ගීකරණය වශයෙන් ඇඟළුම් නිෂ්පාදන , පාවහන් හා සම් භාණ්ඩ නිෂ්පාදන , සේවා , ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන , කෘෂි ආශ්‍රිත නිෂ්පාදන , රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන , කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන , ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන , රබර් ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වා දිය හැක.

මෙලෙස ගෘහ කර්මාන්ත ඇතිකිරීමේ වැඩසටහන තුළ ක්‍රියාත්මක වූ ක්‍රියාකාරකමක් ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ පැවති ප්‍රදර්ශනයේ දී ගෘහ කර්මාන්ත ආරම්භ කිරීමට කැමැත්ත පළ කළ ප්‍රතිලාභීන්ගේ ඒ සඳහා ඇති හැකියාව පිළිබඳ නැවතත් පරීක්ෂා කර එමගින් නිවැරදිව තෝරා ගන්නා ප්‍රතිලාභීන්ට අවශ්‍ය පුහුණුවීම් හා යෙදවුම් ලබා දීම හා 2011 වර්ෂය තුළදී රත්නපුර , අනුරාධපුරය , යාපනය , හම්බන්තොට , මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කවල කර්මාන්ත ප්‍රදර්ශන පැවැත්වීම ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

“දිවි නැගුම” යන්නෙන් වචනයේ අර්ථය වන්නේ ජීවිතය නගා සිටුවීමයි. එනම් පවත්නා තත්ත්වයට වඩා ඉහළට යාමක් පිළිබඳවයි. මහින්ද චින්තනය යටතේ යොජනා වී ඇති මෙම “දිවි නැගුම” ව්‍යාපතිය දෙස බලන විට එයින් මිනිස් ජීවිතයේ උසස් වීමක් ඇතිවන බවට පැහැදිලිවම දැකිය හැකි සුභවාදී සංකල්පයකි. “දිවි නැගුම” වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී වසම් 14,008 ක් තුළ සමෘද්ධි නිලධාරී , කෘෂි පර්යේෂක නිලධාරී , ග්‍රාම නිලධාරී සහ පවුල් සෞඛ්‍ය සේවිකා යන අයගේ සේවා සෘජුවම ලබා ගනිමින් පවුල් දශ ලක්ෂයක පෝෂණ මට්ටම ඉහළ නැංවීමට යෝජිතය. මෙමගින් කෘෂිකර්මය, ධීවර/ සත්ත්ව හා කර්මාන්ත යන අංශ 3 පිළිබඳව මනා අවධානයක් යොමු කරන ව්‍යාපෘතියක් ලෙස දැකිය හැකියි. අනාගතයේ පැමිණිය හැකි ආහාර පිළිබඳ ප්‍රශ්නය සඳහා මෙම වැඩසටහන ඉතාම උචිත එකක් බව පෙනෙයි. මන්ද මෙමගින් පැහැදිලිවම ආහාර සුරක්ෂිතතාවයට මුල් තැනක් ලබා දෙන බැවිනි (දෙසතිය, 2011).

සමෘද්ධි බැංකු සංගම් චක්‍රිය අරමුදල මගින් ද සෘජු ණය ලෙස රු. 40,000 ක මුදලක් ලබා ගැනීමට පහසුකම් සැලසීම ජනතාවට වැඩි වරප්‍රසාද ලැබීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරවීමේ අවස්ථාවක් දැකිය හැකියි. ඒ අනුව ආපසු අය නොකරන ප්‍රතිලාභ ලෙස යෙදවුම් හා අනෙකුත් සේවා සඳහා රු. 10,000 ක ප්‍රදානයක් ලෙස රු. 84,000 ක් ද මීට අමතරව ණය පහසුකම් ලෙස සමෘද්ධි බැංකුව මගින් රු. 250,000 ක් චක්‍රිය අරමුදලින් 40,000 ජීවනෝපාය සංවර්ධන අංශයෙන් රු 40000 ක් ලෙස රු. 424,000 ක මුදලක් වනම් රු. මි 0.424 ක් පවුල් ඒකකයකට ලැබෙන පරිදි “දිවි නැගුම” වැඩ පිළිවෙල සකස් වීම ඉතාම වැදගත් වේ. විචාරශීලීව බැලීමෙන් පෙනෙන්නේ පොදු ජනතාවගේ දිවිය සුරක්ෂිත කිරීමටත් දේශීයත්වය නැවත ඔප් නැංවෙන ආකාරයටත් දිවි නැගුම වැඩපිළිවෙල සකස් වී ඇති බවයි (මහ බැංකුව, 2012).

2014 වසර ආරම්භයේදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා උඩරට සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ කිරීමෙන් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය. මහින්ද චින්තනයට අනුව ශ්‍රී ලංකාවේ දිළිඳුකම අඩුකිරීමේ දැක්මෙන් යුතුව පුද්ගලයන් මිලියන 5 කට පමණ ප්‍රතිලාභ සලසමින් පවුල් මිලියන 1.8 ක ජීවන තත්ත්වය උසස් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ අරමුණ විය (මහ බැංකුව, 2013).

කොරියාවේද මෙවැනි ක්‍රමයක් ක්‍රියාත්මක වීමක් දැකගත හැකියි. “Samaul Undong” ලෙස එය හැඳින්වේ. මෙම ක්‍රමය මගින් කොරියාවේ ගම සංවර්ධනය වීමක් බලාපොරොත්තු වේ. මෙම ක්‍රමය පිළිබඳ “Samaul Undong” අංශයේ සභාපති **Lee, Jai Chang** මහතා ප්‍රකාශ කරන්නේ මෙවන්නකි. 1970 සිට අවුරුදු 40 ක් තුළ මෙම ක්‍රමය ක්‍රියාත්මක වන බව හා මෙය සමාජ දියුණුව සඳහා ඇති ජාතික වැඩසහෙනක් බවයි. මෙහිදී මූලික වශයෙන් කෘෂිකර්මය පිළිබඳ අවධානය යොමුවන අතර ගම දියුණු කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමුවේ. නමුත් “දිවි නැගුම” වැඩසටහන තුළින් ගම මෙන්ම නගරය ද දියුණු කිරීම පිළිබඳ අවධානය යොමු වූහ.

**නිගමනය**

මෙම වැඩසටහනෙහි ස්වභාවය අනුව ප්‍රායෝගික වශයෙන් ඉතාම ප්‍රතිඵලදායක වැඩසහනක් ලෙස හැඳින්විය හැකිය. එයින් ජාතික මට්ටමින් ආහාර පිළිබඳ ස්වංපෝෂිතභාවයක් ඇතිවීමක් සිදුවේ. තමන්ගේ ගෙවත්තෙහි තම තමන්ට අවශ්‍ය කරන භෝග නිෂ්පාදනය කර ගත හැකි වීම, එම පවුල් සඳහා අමතර ආදායමක් ලැබීමක් ලෙස දැකිය හැක. එමගින් විෂ සහිත එළවළු , පළතුරු පරිභෝජන අඩුවීමත්, ලෙඩ රෝග සෑදීම අවම වීමත් සිදුවේ. එමෙන්ම මෙය ජනතාව ඉලක්ක කර ගත් "ජන මූල වැඩසටහනක්" ලෙස හැඳනිවිය හැකිය. මෙය සමෘද්ධි පවුල්වල ආර්ථිකය ශක්තිමත් කිරීමට බෙහෙවින් ඉවහල් විය.

අනෙක් අතට මෙමගින් මෙම දෙපාර්තමේන්තුව යටතට ගැනෙන සියලු සේවකයින් රජයේ විශ්‍රාම වැටුප් සහ රාජ්‍ය සේවකයින්ට හිමි සියලු දීමනා ලැබෙන රජයේ සේවක පිරිසක් බවට පත්වීමක් සිදුවනවා මෙන්ම ප්‍රතිලාභීන් සඳහා ලැබෙන සියලු ප්‍රතිලාභවල සුරක්ෂිතතාවය නව පනත තුළ තහවුරු කරන බව ප්‍රකාශ විය. මෙමගින් තවත් රාජ්‍ය සේවකයින් කණ්ඩායමක් ඇති වීමක් දැකිය හැකි අතර විශාල නිලධාරිවාදයක් ඇතිවීම දක්නට ලැබෙන තත්ත්වයකි. ලෝකයේ සෙසු රටවල් පෞද්ගලීකරණය වෙත යන ගමනේ මෙලෙස විශාල රාජ්‍ය අංශයේ සේවක පිරිසක් සමන්විත වීම අකාර්යක්ෂමතාවය ඇතිවීමට රුකුල් දෙන්නක් ලෙස හැඳින්විය හැකිය. එමෙන්ම ප්‍රායෝගික වශයෙන් බලන කල මෙතරම් නිලධාරී ප්‍රමාණයක් තුළ අතිරික්ත සේවක පිරිසක් අඩංගුවීම සම්පත් නාස්ති වීමක් ලෙස ද දැක්විය හැකිය.

එමෙන්ම සත්ත්ව පාලන වැඩකටයුතු වලදී ඒ සඳහා ඔවුන්ට යම් කිසි වියදමකක් දැරීමට සිදුවේ. මෙලෙස බලන විට නැවත අතීතයේ පැවති ආකාරයේ ආර්ථිකයක් ගොඩනැංවෙන තත්ත්වයකට ගමන් කිරීමක් දෝ යන ප්‍රශ්නය පැන නැගේ. එමෙන්ම ගෘහාශ්‍රිත මට්ටමින් වගා කිරීම පිළිබඳ වර්තමාන කාර්යබහුල මිනිස් ජීවිත හා කෙතරම් ගැළපේද යන්න ප්‍රායෝගික ගැටළුව ද ඉස්මතු වේ.

කෙසේ වුව ද ප්‍රායෝගික වශයෙන් සාර්ථක වියහැකි ස්ථාවර වැඩපිළිවෙලක් යටතේ සාර්ථක තත්ත්වයක් උදාකර ගත හැකි ජනයාට ඉතාම සමීප විය හැකි වැඩපිළිවෙලක් ලෙස "දිවි නැගුම" වැඩපිළිවෙල හඳුන්වා දිය හැකිය. නිෂ්පාදනය හා ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි අමුද්‍රව්‍ය, උපදේශන සේවා සහ තාක්ෂණ පහසුකම් සැපයීම, ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන ගබඩා කිරීම හා අලෙවි කිරීමට පහසුකම් සැලසීම මෙම වැඩසටහන මගින් සිදු වේ. ඔවුන්ගේ ආත්ම විශ්වාසය, සාමූහික වගාකිරීම, යහපත් ගුණ ධර්ම ප්‍රවර්ධනය කිරීම ආදී පරමාර්ථ රාශියක් සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කිරීම මෙම වැඩපිළිවෙලෙහි සාර්ථක බව කියාපාන සාධක ලෙස පෙන්විය හැකිය. ඉදිරි ලෝකයේ ඇතිවිය හැකි අර්බුද බොහොමයක් සඳහා දිවි නැගුම වැඩසටහන විසඳුමක් වන ආකාරයක් දැකිය හැකිය. එබැවින් වර්තමාන සමාජ ආර්ථික පාරිසරික හා ගෝලීය වාතාවරණය හා ඉදිරි ප්‍රවනතා තුළ සංවර්ධන ප්‍රවේශයක් ලෙස "දිවි නැගුම" වැඩසටහන ඇතැම් අඩුපාඩුකම් පැවතුන ද ජනතාවට වඩාත් සාර්ථක වූ වැඩදායී වැඩසටහනක් ලෙස පෙන්වා දිය හැකිය. කෙසේ වෙතත් දිවි නැගුම වැඩසටහන සාර්ථක සංවර්ධන වැඩසටහ නක් වුවත් වර්ෂ 2015 දේශපාලන වෙනස්වීමත් සමග වර්තමානය තුළ ක්‍රියාත්මක වීම අත්හිටුවා ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

දිණමිණ , සමෘද්ධි, (2012) ඔක්තෝබර්

දිණමිණ ,සමෘද්ධි, (2012) ජූනි

දිවි නැගුම අත්පොත, (2014), ආර්ථික සංවර්ධන අමාත්‍යංශය, කොළඹ

දෙසතිය, (2011) නොවැම්බර්/දෙසැම්බර්

ශ්‍රී ලංකා මහ බැංකුව, (2012), මහ බැංකු වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ

ශ්‍රී ලංකා මහ බැංකුව, (2013), මහ බැංකු වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ